මීරිගම ප්‍රාදේශීය සභාව - 2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මීරිගම ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 (1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට මීරිගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1. පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම.

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	ප්‍රමිතියේ 2 වන පරිච්ඡේදයේ 2.5 ඡේදය ප්‍රකාරව සහ ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ රීති අංක 90 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත ගිණුම් තැබිය යුතු වුවත්, පෙර වර්ෂයන් සඳහා සමාලෝචිත වර්ෂය තුලදී ලැබී තිබූ උසාවි දඩ සහ මුද්දර ගාස්තු වටිනාකම් පිළිවෙලින් රු.13,898,264 ක් සහ රු.105,469,302 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.	2025 ගිණුමෙන් නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ආ)	මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කිරීමේදී ප්‍රමිතියේ 3 වන පරිච්ඡේදයේ 3.31 සහ 3.29 ඡේද ප්‍රකාරව මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය ගණනයේදී, අතිරික්තය සඳහා ගැලපිය යුතු ක්ෂය වටිනාකම රු.55,795,811 ක් වුවත් රු.57,118,364 ක් වශයෙන් ගැලපීමද, වත්කම් විකිණීමේ පාඩුව රු.493,878 ක් සහ ස්ථාවර තැන්පත් පොලී ආදායම රු.6,474,134 ක් ගලපා නොතිබීමද, ආයෝජන ක්‍රියාකාරකම්වලින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය සඳහා ස්ථාවර තැන්පත් පොලී ආදායම රු.4,768,323 ක් ගලපා නොතිබීමද නිරීන්ෂණය විය.	2025 ගිණුමෙන් නිවැරදි කරන බව.	ඡේදයේ යොමුගත අඩුපාඩු නිවැරදි කර ගත යුතුය.

1.6.2. ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කර්මාන්ත ණයගැති වෙන් කිරීම් වටිනාකම රු.773,628 ක් සමාලෝචිත වර්ෂයේ නිවැරදි කිරීමේදී ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම වෙනුවට සමුච්චිත අරමුදල හර කර තිබුණි.	2025 ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ආ)	මාර්ග පාලම් බෝක්කු ලෙස දක්වා තිබුණු රු.3,915,750 ක් වූ ගොඩනැගිලි වටිනාකමක් නිවැරදි කිරීමේදී ඊට අදාලව ගිණුම්ගත කර තිබුණු ක්ෂය රු.1,174,725 ක් මාර්ග, පාලම්, බෝක්කු ක්ෂය වෙන් කිරීමේ ගිණුම හර කර සමුච්චිත අරමුදල බැර කර නොතිබුණි.	2025 ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ඇ)	ගිණුම්ගත කර නොතිබුණු ගොඩනැගිලි 2 ක ක්ෂය වටිනාකම රු.2,697,111 ක් ගිණුම්ගත කිරීමේදී සමුච්චිත අරමුදල හර කරනු වෙනුවට සංචිත හා වෙන් කිරීමේ ගිණුම හර කර තිබුණි.	2025 ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ඈ)	ගොඩනැගිලි ඉදිකිරීම් හා ප්‍රතිසංස්කරණය කිරීම් වටිනාකම රු.8,959,169 ක් පාරවල්, පාලම්, බෝක්කු ලෙස දක්වා තිබුණු අතර රු.1,838,287 ක් වූ ගොඩනැගිලි වටිනාකමක් වියදම් ලෙස දක්වා තිබුණි.	2025 ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ඉ)	ගෙවිය යුතු රැඳවුම් මුදල රු.438,512 ක් ගොඩනැගිලි සහ කර්මාන්ත ණයහිමි ලෙස ගිණුම්ගත කර නොතිබුණි.	2025 ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ඊ)	වත්කම් සමීක්ෂණ වාර්තාව අනුව මාර්ගයක් බව දක්වා තිබුණු වටිනාකම රු.62,000 ක් ඉඩම් ලෙස ගිණුම්ගත කර තිබුණි.	2025 ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(උ)	සමාලෝචිත වර්ෂයට අදාලව වරිපනම් ශේෂ නිවැරදි කිරීම් රු.49,907 ක් වරිපනම් ගිණුම හර කරනු වෙනුවට සමුච්චිත අරමුදල හර කිරීමද, වරිපනම් බිල් කිරීම් නිවැරදි කිරීම් රු.83,499 ක් වරිපනම් ගිණුම බැර කරනු වෙනුවට සමුච්චිත අරමුදල බැර කිරීම ද සිදු කර තිබුණි.	සමුච්චිත අරමුදල හර කිරීම් රු.49,907 ක් සහ බැර කිරීම් රු.83,499 ක් වන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.

1.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371	1991 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා කාලයක සිට පැවති නොපියවූ අත්තිකාරම් ශේෂය රු.5,407,709 ක් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	අදාල තොරතුරු සොයාගත නොහැකි බව.	තොරතුරු සොයා බලා අත්තිකාරම් පියවා ගත යුතුය.

2 මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.69,512,208 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.34,416,743 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

		2024				2023			
	ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තු ගත ආදායම	බිල් කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තු ගත ආදායම	බිල් කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
	---------------	---------------	----------	----------	---------------	--------------	-----------	----------	----------
		රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000
(i)	වරිපනම් හා බදු	19,280	18,939	16,992	8,438	15,019	14,297	9,642	7,130
(ii)	කුලී	38,903	43,838	34,458	15,274	30,101	33,172	33,959	6,033
(iii)	බලපත්‍ර ගාස්තු	2,350	1,981	1,975	66	2,150	2,318	1,771	60
(iv)	වෙනත් ආදායම්	23,290	25,244	23,568	896	34,442	30,541	30,559	0
		--------------	-----------	-----------	---------------	-------------	------------	----------	-------------
		83,823	90,002	76,993	24,674	81,712	80,328	75,931	13,223
		========	======	======	========	========	=======	======	========

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**වරිපනම් හා බදු**		
(i)	සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට හිඟ වරිපනම් කාලවිශ්ලේෂණ වාර්තාව අනුව ශේෂය රු.8,688,388 ක් තුල වර්ෂ 10 ට වැඩි රු.1,264,364 ක් ද, වර්ෂ 5 ත් 10 ත් අතර රු.2,790,961 ක් ද, වර්ෂ 3 ත් 5 ත් අතර රු.664,475 ක් ද, වර්ෂ 1 ත් 3 ත් අතර රු.1,569,230 ක් ද, වර්ෂයකට අඩු රු.2,399,358 ක් ද පැවතුණි.	උප කාර්යාලවල හිඟයෙන් සියයට 13 ක්, සියයට 24 ක්, සියයට 38 ක් සහ සියයට 31 ක් 2025 මැයි 19 දිනට අය කර ඇති බව.	හිඟහිටි වරිපනම් ආදායම අය කළ යුතුය.
(ii)	සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට පැවති රු.57,882 ක අක්කර බදු ශේෂයෙන් වර්ෂය තුල රු.26,293 ක් අයකිරීමත් වර්ෂයේ බිල් කිරීම් රු.32,582 කින් රු.14,681 ක් අයකිරීමත් නිසා අයකිරීම්වල ප්‍රගතිය සියයට 45 ක් වැනි අඩු ප්‍රගතිය ගෙන තිබුණි.	උප කාර්යාලවල හිඟයෙන් සියයට 13 ක්, සියයට 24 ක්, සියයට 38 ක් සහ සියයට 31 ක් 2025 මැයි 19 දිනට අය කර ඇති බව.	හිඟ අක්කර බදු ආදායම් අය කළ යුතුය.
(ආ)	**කුලී**		
(i)	හිඟ කඩ කුලී රු.14,526,725 ක ශේෂය තුල, වර්ෂ 1 ත් 3 ත් අතර රු.7,288,325 ක් ද, වර්ෂ 1 ට අඩු රු.7,238,400 ක් ද විය.	තක්සේරු සංශෝධනයෙන් පසු අය කිරීමත් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීමත් සිදු කරන බව.	හිඟ කඩ කුලී ආදායම් අයකළ යුතුය.
(ii)	වසර 5 ක කාලයක සිට පැවත එන මස්කඩ හා මාළු කඩ හිඟ ටෙන්ඩර් කුලිය රු.659,156 ක් අයකර ගෙන නොතිබුණි.	නීතිමය ක්‍රියා මාර්ග ගන්නා බවට ටෙන්ඩර් කරුවන් දැනුවත් කර ඇති බව.	හිඟ ටෙන්ඩර් කුලී ආදායම අයකළ යුතුය.
(ඇ)	**බලපත්‍ර ගාස්තු**		
	හිඟ කර්මාන්ත බදු ශේෂය රු.44,330 ක් වර්ෂ 10 කට වැඩි කාලයක සිට ද හිඟ වෙළඳ බලපත්‍ර ශේෂය රු.59,725 ක් වසර 14 කට වැඩි කාලයක සිට ද පැවතුණද අයකර ගෙන නොතිබුණි.	අයකර ගැනීමට කටයුතු කරන බව.	හිඟ කර්මාන්ත බදු සහ වෙළඳ බලපත්‍ර ආදායම් අය කළ යුතුය.

(ඇ) **වෙනත් අදායම්**

2020 වර්ෂයෙන් පසු වර්ෂවලට අදාලව උසාවි දඩ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව.	උසාවි දඩ ආදායම අය කළ යුතුය.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1. පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ලැබී තිබුණු මහජන පැමිණිලි 576 ක් අතරින් පැමිණිලි 288 ක් පමණක් විසඳමින් පැවතුණි.	පැමිණිලි 288 ක් නිම කර ඇති බව.	සියළුම මහජන පැමිණිලි විසඳිය යුතුය.
(ආ)	1980 අංක 56 දරන (සංශෝධිත) ජාතික පාරිසරික පනතේ 23(අ) වගන්තිය යටතේ පවරා ඇති බලතල ප්‍රකාරව බලපත්‍ර ලබාගත යුතු කටයුතු පිළිබඳව 2022 ජනවාරි 27 දිනැති අංක 2264/18 දරන අති විශේෂ ගැසට්පත්‍රය මගින් නිශ්චය කර උපලේඛනයේ (ඇ) කොටසේ ආදාහනාගාර ඇතුලත්ව ඇතත්, සභාව මගින් පවත්වාගෙන යනු ලබන ආදාහනාගාරය සම්බන්ධයෙන් පරිසර බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි.	ඉඩමට ඔප්පුවක් නොමැති වීම ගැටළුවක් වී ඇති බව.	ගැටළුව විසඳා ගෙන පරිසර බලපත්‍රය ලබාගත යුතුය.

3.2 **කළමනාකරණ** අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කර්මාන්ත ණයගැති කාල විශ්ලේෂණ වාර්තාව අනුව සමාලෝචිත වර්ෂය අවසන් දිනට ශේෂය රු.25,865,515 ක් තුල වර්ෂ 5 ත් 10 ත් අතර රු.3,359,621 ක් ද, වර්ෂ 3 ත් 5 ත් අතර රු.995,000 ක් ද, වර්ෂ 1 ත් 3 ත් අතර රු.286,847 ක් ද විය.	රු.2,083,845 ක් අය වී ඇති බව.	ණයගැති ශේෂ අයකර ගැනීමට හෝ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය.

(ආ)	කර්මාන්ත ණයගිමි කාල විශ්ලේෂණ වාර්තාව අනුව සමාලෝචිත වර්ෂය අවසන් දිනට ශේෂය රු.33,186,861 ක් තුල වර්ෂ 5 ත් 10 ත් අතර රු.3,873,354 ක් ද, වර්ෂ 3 ත් 5 ත් අතර රු.1,781,029 ක් ද, වර්ෂ 1 ත් 3 ත් අතර රු.533,431 ක් ද, වර්ෂ 1 ට අඩු රු.23,149,087 ක් ද විය.	වසර 1 ට අඩු ශේෂයෙන් රු.2,007,362 ක් ගෙවා ඇති බව.	ණයගිමි ශේෂ නිරවුල් කළ යුතුය.
(ඇ)	කඩ හිමියන් විසින් සෘජුවම බැංකුවට තැන්පත් කරන ලද රු.199,150 ක් නිවැරදිව හඳුනා ගැනීමකින් තොරව 2023 වර්ෂයේ සිට මිශ්‍ර තැන්පත් ලෙස දක්වා තිබුණි.	ගිණුම්වලට ගැලපීමට කටයුතු කරන බව.	කඩ හිමියන් නිශ්චිතව හඳුනාගෙන නිරවුල් කළ යුතුය.

3.3. **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2023 ජූලි 14 දිනැති රජයේ තක්සේරු දෙපාර්තුමේන්තුවේ නව තක්සේරුව යටතේ කඩ කාමර 34 ක කඩ කුලී බිල් කර ඇතත්, ඒ අනුව ගිවිසුම්ගත වී නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ අවසන් දින වනවිට හිඟ කඩකුලී වටිනාකම රු.2,959,500 ක් විය.	මාසික කුලිය නැවත සංශෝධනය කර ගෙන පියවා ගැනීමට කටයුතු කරන බව.	ගිවිසුම්ගතවී හිඟ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	කඩහිමියන් විසින් කොරිඩෝව ආවරණය වන පරිදි කඩ කාමර 9 ක් පාර දක්වාම විශාල කරගෙන තිබුණු නමුත් සභාව නීතිමය පියවර ගෙන නොතිබුණි.	ඉදිරි සභා වාරයකදී අවසන් තීරණයක් ලබා ගැනීමට අපේක්ෂා කරන බව.	අනවසර ඉදිකිරීම් ඉවත්කළ යුතුය.
(ඇ)	ප්‍රමාණය වර්ග අඩි 180 ක්වූ කඩ කාමරය දෙමහල් ගොඩනැගිල්ලක් බවට පත් කිරීමට 2021 වර්ෂයේදී කරන ලද ඉල්ලීම මහා සභාව විසින් අනුමත කර වැඩි කරගෙන ඇති වර්ග ප්‍රමාණය වන වර්ග අඩි 838.49 ක් වෙනුවෙන් රු.838,490 ක් ගෙවන ලෙස කඩහිමියන්ට දන්වා ඇතත්, ගෙවා නොතිබුණු අතර ගොඩනැගිල්ල අනුමැතියකින් තොරව මහල් 3 ක් දක්වා ඉදි කර තිබුණද, අනවසර ඉදි කිරීම් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	ඉදිරි සභා වාරයකදී අවසන් තීරණයක් ලබා ගැනීමට අපේක්ෂා කරන බව.	අනවසර ඉදිකිරීම් ඉවත්කළ යුතුය.

(ඇ)	තනි මහල් කඩ කාමරය අලුත්වැඩියා කර ගැනීම සඳහා 2021 වර්ෂයේදී සභා අනුමැතිය ලැබී තිබුණද 2024 වර්ෂයේ භෞතික පරීක්ෂාව වන විට තෙමහල් ලෙස සංවර්ධනය කර තිබුණි. 2023 වාර්ෂික තක්සේරුව අනුව මාසිකව රු.12,300 ක් බැගින් අයකළ යුතු වුවත් 2019 වර්ෂයේ තාවකාලික තක්සේරුව මත තනි බිම් මහල සඳහා අයකළ මාසික කුලිය රු.750 ක් සමාලෝචිත වර්ෂයේදීත් අයකරමින් පැවතුණි.	තක්සේරු විරෝධතා දෙපාර්තමේන්තුව වෙත යවා ඇති අතර ඒ අනුව ගිවිසුම් ගත කර ගැනීමටත් කුලි අය කර ගැනීමටත් කටයුතු කරන බව.	තක්සේරුව අනුව ගිවිසුම් ගත වී කඩ කුලි අය කළ යුතුය.
(ඉ)	ප්‍රමාණය අඩි 11*9 ක්වූ කඩ කාමරය 2000 වර්ෂයේදී සභා අනුමැතියක් නොමැතිව සම්පූර්ණයෙන්ම කඩා ඉවත් කර අඩි 24*18 ක කඩ කාමරයක් ඉදි කර තිබුණි. 2013 වර්ෂයේදී කඩ කාමරය තුන්වැනි මහල දක්වා ගොඩනගා ගැනීම සඳහා කරන ලද ඉල්ලීම අනුව බදුකරුගේ වියදමින් කඩ කාමරය වැඩි දියුණු කළද සභාව ඉදිරිපත් කරන තක්සේරුව අනුව කඩකුලිය ගෙවිය යුතු බව ප්‍රකාශ කරමින් යෝජනාව සම්මත වී තිබුණි. 2023 වර්ෂයේ නව තක්සේරුව අනුව කඩ කුලිය 2023 සැප්තැම්බර් 01 දින සිට රු.21,000 ක් ලෙස සංශෝධනය වුවත් නව තක්සේරුව අනුව ගිවිසුම් ගත කර ගැනීමටත් කුලිය අයකර ගැනීමටත් කටයුතු කර නොතිබුණි.	තක්සේරු විරෝධතා දෙපාර්තමේන්තුව වෙත යවා ඇති අතර ඒ අනුව ගිවිසුම් ගත කර ගැනීමටත් කුලි අය කර ගැනීමටත් කටයුතු කරන බව.	තක්සේරුව අනුව ගිවිසුම් ගත වී කඩ කුලි අය කළ යුතුය.
(ඊ)	පෙර මුදල් අයකර ගිවිසුම්ගත වීමෙන් පසුව කඩ කාමරවල යතුර ලබා නොදීම හේතුවෙන් 2019 වර්ෂයේදී කුලියට දී තිබූ කඩ කාමර 29 ක හිඟ පෙර මුදල් ශේෂය රු.36,555,174 ක් අයකර නොතිබුණි.	පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ උපදෙස් අනුව ගිවිසුම් ගත කර ගන්නා බව.	හිඟ පෙර මුදල අය කළ යුතුය.

3.4. නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	භූමි ප්‍රමාණය වර්ග අඩි 3,823 ක් සහ වටිනාකම රු.15,000,000 ක් වූ පල්ලෙවෙල සතිපොල ඌන උපයෝජිතව පැවති අතර පොල භූමිය පිහිටි ඉඩමෙන් පර්චස් 33.37 ක තැපැල් කාර්යාලයක් පිහිටා තිබුණු නමුත් ඒ සඳහා කිසිදු බිම් කුළියක් අයකර නොතිබුණි.	තැපැල් කාර්යාල භූමියේ භුක්තිය පමණක් ගම්පහ ප්‍රාදේශිය තැපැල් අධිකාරි වෙත පවරා ඇති බව.	වත්කම් ඵලදායී ලෙස භාවිතයට ගත යුතුය.

(ආ)	ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ පුර නැගුම ව්‍යාපෘතිය මඟින් රු.මිලියන 26.76 ක් වැයකර 2019 වර්ෂයේදී සභා භූමියේ ඉදි කරන ලද, සභාව මඟින් පවත්වාගෙන යන පානීය ජල ව්‍යාපෘතියේ වැඩ අවසන් කර වර්ෂ 5 ගතවී තිබුණද, ජල මූලාශ්‍රය සිඳීයාම නිසා අසාර්ථක වී තිබුණු අතර, සභාවට අයත් ජල බවුසර් මගින් ව්‍යාපෘතියට ජලය සැපයීම සඳහා සමාලෝචිත වර්ෂයේ ඉන්ධන වියදම පමණක් රු.1,008,748 ක් වැයකර තිබුණි.	විකල්ප ජල ප්‍රභව පවතීදැයි යන්න සොයා බලන බව.	වත්කම් ඵලදායී ලෙස භාවිතයට ගත යුතුය.
(ඇ)	වර්ග අඩි 6,400 ක් සහ වටිනාකම රු.10,500,000 ක් වූ දෙමහල් නව වෙළෙඳ සංකීර්ණයේ බිම් මහල කඩකාමර 26 ත් අතරින් කඩකාමර 15 ක් වසා තිබුණි.	කඩ කාමර සභාවට පවරා ගැනීමට කටයුතු කරන බව.	පවරා ගෙන නැවත ටෙන්ඩර් කළ යුතුය.
(ඈ)	හෙල බොජුන්හලෙහි සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රම භාවිතයෙන් තොරව වෙළඳ කටයුතු සිදු කිරීමත්, ලියාපදිංචි කාන්තාවන් සියල්ල නිෂ්පාදන හා වෙළෙඳාම් කටයුතුවල නිරත නොවීමත්, හෙල බොජුන්හල තුල හා ඒ අවට පිරිසිදු කර නොතිබීමත්, ගොඩනැගිල්ලට පිවිසුමෙහි කඩ කාමරයක් ඉදිකර බේකරි නිෂ්පාදන අලෙවි සැලකට ටෙන්ඩර් කර ලබා දී තිබීමත් නිසා හෙල බොජුන්හලට පැමිණෙන පාරිභෝගිකයින් ඒ වෙත යොමු වීමත්, නිරීක්ෂණය වූ බැවින් ඉදිකිරීම් පිරිවැය රු.3,915,750 ක් වූ හෙල බොජුන්හල ඌන උපයෝජිතව පැවතුණි.	ඉදිරියේදී ගිවිසුමක් සකස් කර මිල ගණන් කැඳවා ලබා දීමට කටයුතු කරන බව.	සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රම භාවිතා කළ යුතු අතර වත්කම් ඵලදායී ලෙස භාවිතයට ගත යුතුය.

3.5. වත්කම් කළමනාකාරණය.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පල්ලෙවෙල නව වෙළඳ සංකීර්ණයේ ඉහල මහල කඩ කාමර 03 ක් පිටුපසට අඩි 5 ක් බැගින් විශාල කරගෙන වෙළෙඳ සංකීර්ණය තුලින් ඉහල මාලයට යැමට සකස් කර තිබුණු පඩිපෙළෙහි පිවිසුම ආවරණය කර අනවසරයෙන් බිත්තියක් බැද තිබුණු අතර, පහත මාලයේ කඩ කාමර 05 ක් දිග අඩි 09 ක් පමණ වූ කොරිඩෝව වීදුරු සහ දැල් යොදා අනවසරයෙන් ආවරණය කරගෙන තිබුණද සභාව ඒ සම්බන්ධයෙන් කටයුතු කර කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	කඩ හිමියන් ගෙන්වා සාකච්ඡා කර තීරණයක් ගන්නා බව.	අනවසර ඉදිකිරීම් ඉවත්කර වත්කම්වල ආරක්ෂාව තහවුරු කළ යුතුය.

(ආ)	වටිනාකම රු.1,800,000 ක් වූ ගොඩනැගිල්ලක සහ වටිනාකම රු.3,400,000 ක් වූ ඉඩමක අයිතිය පවරාගෙන නොතිබුණි.	ඉදිරියේදී කටයුතු කරන බව.	වත්කම්වල අයිතිය පවරාගෙන ආරක්‍ෂාව තහවුරු කරගත යුතුය.
(ඇ)	2024 භාණ්ඩ සමීක්‍ෂණ වාර්තාව අනුව වත්කම් වර්ග 70 ක වත්කම් 278 ක් අදාල කාර්යාලවල බඩු වට්ටෝරු ලේඛනවලට ඇතුලත් කර නොතිබුණි.	ලේඛනවල ඇතුලත් කිරීමට කටයුතු කරන බව.	ලේඛනවලට ඇතුලත් කළ යුතුය.
(ඈ)	වත්කම් සමීක්‍ෂණ වාර්තාව අනුව සභාවේ නමට නොපවතින ඉඩම මූල්‍ය ප්‍රකාශනයේ ඉඩම් 2 ක් ලෙස රු.33,200,000 කට ද, ශාලා 2 ක් ඉදි කර ඇත්තේ සභාව සතු ඉඩම්වල නොවූව ද ගොඩනැගිලි වටිනාකම ලෙස රු.2,487,425 කටද මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබුණි.	මේ පිළිබඳව සොයා බලා කටයුතු කරන බව.	වත්කම් සමීක්‍ෂණ නිර්දේශ අනුව කටයුතු කළ යුතුය.
(ඉ)	භාණ්ඩ සමීක්‍ෂණ වාර්තාවෙහි වටිනාකම රු.35,379 ක් වූ පොත් 88 ක් අස්ථාන ගතවීද, රු.100,000 ක් වූ කඩ කාමරයක් භෞතිකව නොමැති බවද දක්වා තිබුණද ඒ පිළිබඳව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	මාස 3 ක් තුළ පොත් ඉදිරිපත් නොවූවොත් වගකිව යුතු නිලධාරීන්ගෙන් අය කර ගන්නා බවත් ලේඛනවලින් ඉවත් කිරීමට දැනුවත් කර ඇති බව.	මුදල් රෙගුලාසි අනුව කටයුතු කර වත්කම්වල ආරක්ෂාව තහවුරු කරගත යුතුය.

3.6. මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රාථමික ශ්‍රේණිය තුල තනතුරු 13 ක පුරප්පාඩු ද, ද්විතීයික ශ්‍රේණියේ තනතුරු 2 ක අතිරික්ත ද වී තිබුණි.	පිළිගෙන ඇති බව.	පුරප්පාඩු පිරවීම ද අතිරික්ත අනුමත කරගැනීම ද කළ යුතුය.
(ආ)	මියගිය සහ සේවය අතහැර ගිය සේවකයන් 8 දෙනෙකුගෙන් රු.1,006,274 ක ණය හා අත්තිකාරම් ශේෂයක් අය කරගෙන නොතිබුණි.	අයකර ගැනීමට කටයුතු කරන බව.	සේවක ණය අය කළ යුතුය.

3.7. වාහන උපයෝජනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ට්‍රැක්ටරයක් අළුත්වැඩියාව සඳහා විවෘත මිල කැඳවීමකින් තොරව පුද්ගලික ආයතනයක් වෙතින් 2024 ජනවාරි 30 දින රු.442,000 ක ද, 2024 සැප්තැම්බර් 26 දින රු.144,900 ක ද, දින රහිත ලිපියක් මඟින් රු.125,000 ක ද ඇස්තමේන්තු ලබාගෙන යාන්ත්‍රික ඉංජිනේරු නිර්දේශය ලබා නොගෙන 2024 ඔක්තෝම්බර් 25 දින වන විට අලුත්වැඩියා කටයුතු නිමකර තිබුණි.	ඉදිරියේදී අඩුපාඩු නිවැරදි කර ගන්නා බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය.
(ආ)	සභාව සතු ත්‍රීරෝද රථ 4 ක මීටර ක්‍රියා විරහිත වී තිබුණු අතර, ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	ඉදිරියේදී අළුත්වැඩියා කටයුතු සිදු කරන බව.	වාහන නිසි පරිදි නඩත්තු කළ යුතුය.